## WEATHER FORECAST FOR 25th April 2019
## (Issued at 1200 noon on 24th April 2019)

**A low pressure area is likely to develop over Equatorial Indian Ocean and adjoining southwest Bay of Bengal to the southeast of Sri Lanka around 25th April 2019. General public, Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

Showers or thundershowers will occur over most parts of the island after 2.00 p.m. Heavy falls about 100 mm can be expected at some places in Sabaragamuwa, Central, Southern and Uva provinces and in Ampara district.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

සමකය ආසන්න නිරිතදිග බෙංගාලබොක්ක මුහුදු ප්‍රදේශයේ ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් අඩු පීඩන කලාපයක් අප්‍රේල් මස 25 දින පමණ සිට වර්ධනය වීමේ හැකියාවක් පවතී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස මහජනතාවගෙන් සහ ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල සවස 2.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. සබරගමුව, මධ්‍යම, දකුණු සහ ඌව පළාත්වලත් අම්පාර දිස්ත්‍රික්කයේත් ඇතැම් ස්ථානවලට මි.මී. 100 පමණ තද වර්ෂාපතනයන් ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 24th April 2019)

**A low pressure area is likely to develop over Equatorial Indian Ocean and adjoining southwest Bay of Bengal to the southeast of Sri Lanka around 25thApril 2019. Naval and fishing communities are requested to be attentive further about advisories issued by the Department of Meteorology in this regard.**

Showers or thundershowers will occur at several places in the sea areas off the coast extending from Puttalam to Batticaloa via Galle and Hambantota, particularly in the evening or night.

Winds will be North-easterly in the sea area extending from Kankasanturai to Hambantota via Trincomalee and Batticaloa and winds will be variable in direction in the other sea areas around the island.

Wind speed will be 15-25 kmph in the sea areas around the island.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
## 2019 අප්‍රේල් මස 24 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.

සමකය ආසන්න නිරිතදිග බෙංගාලබොක්ක මුහුදු ප්‍රදේශයේ ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් අඩු පීඩන කලාපයක් අප්‍රේල් මස 25 දින පමණ සිට වර්ධනය වීමේ හැකියාවක් පවතී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

පුත්තලම සිට ගාල්ල සහ හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල, විශේෂයෙන් සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමන අතර දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල වල සුළං නිශ්චිත දිශාවකින් තොරව හමයි.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය පැ.කි.මී. 15-25 පමණ වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

24/04/2019

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date :2019.04.24
Time :1200 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE